# ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
## රියදුරු තනතුර සඳහා බඳවා ගැනීම

1. පොදු සුදුසුකම් :
   1.1 විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
   1.2 උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
   1.3 අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වනවිට වයස අවු. 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
   1.4 තනතුරට පැවරෙන කාර්යන් මැනවින් ඉටුකිරීමට හා සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
2. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :
   මෙම තනතුර ස්ථිරය. පත්වීම ලැබූ දින සිට අවු. 03ක පරිවාස කාලයකට යටත් වේ. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම සහිත වේ. රජය විසින් පනවනු ලැබූ පොදු නීති, කොන්දේසි සහ නියමයන්ට යටත් ය. සේවා අවශ්‍යතාව මත විධිමත් ක්‍රමවේදයන් අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.
3. තනතුරු නාමය : රියදුරු III ශ්‍රේණිය
4. වැටුප් ප්‍රමාණය :
   PL 3-2006A-(රු. 12,670-10x130-10x145-10x160-12x170-රු. 19,060)
5. සුදුසුකම් :
   5.1 අධ්‍යාපන—
   අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී යටත් පිරිසෙත් විෂයන් දෙකක් සමත්ව තිබිය යුතුය.
   5.2 ශිල්පීය/නිපුණතා/ප්‍රවීණතා—
   මෝටර් රථ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල බී. සී. ඩී. කාණ්ඩයේ වලංගු මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. මෝටර් රථ රියදුරන් රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද ලබා තිබිය යුතුය.